ආයුර්වේද වෛද්‍ය සභාව - 2024

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ආයුර්වේද වෛද්‍ය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සභාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) 1961 අංක 31 දරන ආයුර්වේද පනත III වන කොටස			
(i) 11(1) උප වගන්තියේ (ඉ) ඡේදය	ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරුන් විසින් ඔවුන් අතරින් තෝරා පත්කර ගනු ලැබූ සමාජිකයන් තිදෙනෙකු සභවේ සමාජිකයන් ලෙස පත්කළ යුතු නමුත් එම සමාජිකයන් තිදෙනා පත් කිරීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි.	1963 මාර්තු 15 දිනැති 13564 අංක දරන ගැසට් පත්‍රය අනුව ආයුර්වේද කොමසාරිස්වරයා විසින් ඡන්ද විමසීමක් පැවැත්වීම සිදු කළ යුතු අතර අධික වියදම හා ක්‍රමවේදය කාලානුරූප නොවීම මත එය අපහසු බැවින් 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ අදාළ කොටස් සංශෝධනය කර ගැනීමට 2022 ජුනි 07 දින වෛද්‍ය සභාව විසින් තීරණය කරන ලද බව.	ආයුර්වේද පනතට අනුව කටයුතු කළ යුතු අතර එසේ කටයුතු කළ නොහැකි වන ප්‍රායෝගික දුෂ්කරතා ඉවත් කර ගැනීමට කඩිනම් පියවර ගත යුතුය. මෙය වසර ගණනාවක සිට පෙන්වා දී ඇති අඩුපාඩුවක් බැවින් ප්‍රමුඛතාවය ලබා දිය යුතුය.
(ii) 18 (ඇ) හා (ඈ) ඡේද	2024 දෙසැම්බර් 31 දිනට සභාවේ ලියාපදිංචිව තිබුණු හෙද නිලධාරින් සංඛ්‍යාව 39ක් හා භෛසජ්ජකවරුන් සංඛ්‍යාව 260ක්වූ අතර ලියාපදිංචිය කාලානුරූපව අලුත් කිරීමේ ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණු බැවින් එම සංඛ්‍යා යාවත්කාලීන වී නොතිබුණි. ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රයට සුවිශේෂ වු හෙද	ආයුර්වේද ක්ෂේත්‍රයට සුවිශේෂී වූ හෙද නිලධාරීන් බඳවා ගැනීමට අදාළව කටයුතු කළ යුත්තේ ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් බව, බටහිර හෙද පුහුණු පාසැලෙන් පුහුණුව ලබන හෙද නිලධාරීන් ආයුර්වේද රෝහල් සඳහා ද සේවය සඳහා යොමු කර ඇති බවත් ඔවුන් ශ්‍රී ලංකා හෙද සභාවේ ලියාපදිංචිය	පනතේ අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතු අතර එසේ කටයුතු කළ නොහැකි වන ප්‍රායෝගික දුෂ්කරතා ඉවත් කර ගැනීමට කඩිනම් පියවර ගත යුතුය. මෙය වසර ගණනාවක සිට පෙන්වා දී ඇති අඩුපාඩුවක් වන බැවින් ප්‍රමුඛතාවය ලබා දිය යුතුය.

	නිලධාරීන් බඳවා ගෙන පුහුණු කිරීමේ ක්‍රමවේදයක් අනුගමනය කිරීම වෙනුවට බටහිර වෛද්‍ය ක්‍රමවේද යටතේ පුහුණුව ලැබූ හෙද නිලධාරීන් 100ක් ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රය සඳහා බඳවා ගෙන තිබුණද, අපේක්ෂිත මට්ටමින් පනතේ අරමුණු ඉටුකර ගැනීමට නොහැකිව තිබුණි.	ලබා තිබීම නිසා ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචිය අනවශ්‍ය බව ඔවුන් සඳහන් කරන බව, ආයුර්වේද රෝහල් සඳහා සේවයට පැමිණෙන බටහිර හෙද නිලධාරීන් සඳහා මාස තුනක පූර්ණ කාලීන පුහුණුවක් ආරම්භ කර ඇති බව, ඖෂධවේදීන් ගේ තොරතුරු යාවත් කාලීන කිරීම හා ලියාපදිංචිය නොලබා සිටින ඖෂධවේදීන් වෛද්‍ය සභාවේ ලියාපදිංචි කිරීමට අදාළව තොරතුරු රැස් කිරීම සඳහා සියළු පළාත් ආයුර්වේද කොමසාරිස්වරුන් හා මධ්‍යම ආයුර්වේද රෝහල් අධ්‍යක්ෂවරුන් වෙත ලිපියක් යොමු කර ඇති අතර තොරතුරු ලද පසු ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන බව, ඒ අනුව 2025 වර්ෂය තුල දී ආයුර්වේද හෙද හෙදියන්, ආයුර්වේද ඖෂධවේදීන් හා ආයුර්වේද සම්භාහන ශිල්පීන් ලියාපදිංචි කිරීමට අදාළ රීති සකස් කර ඔවුන්ගේ ලියාපදිංචිය යාවත් කාලීන කිරීමට කටයුතු කරන බව.	
(iii) 19(1) උප වගන්තියේ (අ) ඡේදය	සභාව විසින් එම සභාවේ ලේකම් වශයෙන්ද කාර්ය මණ්ඩලයේ ප්‍රධාන නිලධාරියා වශයෙන්ද කටයුතු කළ යුතු ලේඛකාධිකාරිවරයෙකු පත් කළ යුතු වුවද, එම තනතුරට ස්ථිර පදනමින්	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2011 මැයි 23 දිනැති ලිපියෙන් ආයුර්වේද වෛද්‍ය සභාව සඳහා අනුමත කර ඇති කාර්ය මණ්ඩල ප්‍රතිව්‍යුහගතකරණ	මෙම ක්‍රියාවලිය ඉකුත් වසර ගණනාවක් තිස්සේ ක්‍රියාත්මක වන නමුත් මෙතෙක් ප්‍රමාණවත් ප්‍රගතියක් දක්වා නොමැති බැවින් ආයුර්වේද පනතට අනුව කඩිනම් පියවර ගත යුතුය.

ලේඛකාධිකාරීවරයකු පත් කිරීමට කටයුතු නොකර කොන්ත්‍රාත් හා වැඩ බැලීමේ පදනමට දිගින් දිගටම බඳවා ගැනීම් සිදුකර තිබුණි.

යෝජනාවට අනුව, එහි ලේඛකාධිකාරි (කොන්ත්‍රාත් පදනම) තනතුර සඳහා අනුමත කර ඇති බව, නමුත්, ආයුර්වේද වෛද්‍ය සභාවේ සභාපති විසින් 2024 මාර්තු 01 දිනැතිව අංක 2373/43 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ රීති හි අංක 2 යටතේ දක්වා ඇති ආයුර්වේද වෛද්‍ය සභාවේ ලේඛකාධිකාරවරයා බඳවා ගැනීමට අදාළ රීති අනුව පූර්ණකාලීන ලේඛකධිකාරීවරයෙකු බඳවා ගැනීමට අදාළ බඳවා ගැනීමේ පටිපාටියක් සකස් කිරීම සඳහා HM 1-1 වැටුප් කේතය ඉල්ලා යොමු කරන ලද ලිපිය 2025 ජනවාරි 03 දින සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් නිර්දේශකොට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට යොමු කර ඇති බව, මේ සම්බන්ධයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පිළිතුර අනුව ආයුර්වේද වෛද්‍ය සභාවේ ලේඛකාධිකාරී බඳවා ගැනීමේ පටිපාටිය සකස් කර අනුමැතියට යොමු කිරීමට කටයුතු කරන බව.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනත

(i) 38(I) උප වගන්තියේ (ඇ) ඡේදය	සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ හා ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු වුවද සමාලෝචිත වර්ෂයේ එවැනි සමාලෝචනයක් සිදුකර නොතිබුණි.	ආයුර්වේද වෛද්‍ය සභාව කුඩා කාර්ය මණ්ඩලයක් හා වාර්ෂිකව ගෙවීම් වවුචර් 500-600 පමණ ගනුදෙනු වන ආයතනයක් බව, දැනට මෙහි මූල්‍ය කටයුතු අධීක්ෂණය ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී විසින් සිදු කරනු ලබන අතර සභාවේ කටයුතු පහසු කිරීම සඳහා මූල්‍ය සහකාරවරයෙකු ද පත් කර ඇති බව, විශේෂයෙන්ම කාර්තු මට්ටමින් පවත්වනු ලබන විගණන කමිටුව මඟින් ද ආයුර්වේද වෛද්‍ය සභාවට අභ්‍යන්තර පාලනය සම්බන්ධව යෝජනා ඉදිරිපත් කරන අතර එමඟින් පද්ධති ඵලදායි ලෙස සිදු කරගෙන යාමට අවස්ථාව සැලසී ඇති බව.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(I) උප වගන්තියේ (ඇ) ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ii) 38(2) උප වගන්තිය	පනතේ 38 (I) උප වගන්තියේ (ඇ) ඡේදය ප්‍රකාර සමාලෝචනය ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි.	2025 වර්ෂයේ සිට අදාළ පිටපත් විගණකාධිපති වෙත යොමු කිරීමට කටයුතු කරන ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලද බව.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 (I) උප වගන්තියේ (ඇ) ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතුය.

	(iii) 40 වගන්තිය	විගණනය කරනු ලබන අස්ථිත්වයේ පාලක මණ්ඩලය විසින් යථා පරිදි පත් කරනු ලබන තමාගේම අභ්‍යන්තර විගණකවරයකු සිටිය යුතු වුවත් ආයුර්වේද වෛද්‍ය සභාවට අභ්‍යන්තර විගණකවරයෙකු පත්කරගෙන නොතිබුණු අතර ආයුර්වේද දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශය විසින් සභාවේ විගණන කටයුතු සිදු කෙරේ. එසේ වුවද, සමාලෝචිත වර්ෂයේ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.	ආයුර්වේද දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශය මඟින් සකස් කරන විගණන සැළැස්ම තුළ ආයුර්වේද වෛද්‍ය සභාව පිළිබඳ ක්‍රියාකාරකම් ඇතුළත් කිරීමට කටයුතු කරන බව.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ඇ)	2014 ඔක්තෝබර් 15 දිනැති අංක 1884/36 අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත ආයුර්වේද වෛද්‍ය සභා රීති	සභාවේ ලියාපදිංචි සියළුම වෛද්‍යවරුන් වර්ෂ 05කට වරක් සිය ලියාපදිංචිය අළුත් කරගත යුතු වුවද 2024 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 05 ඉක්මවූ වෛද්‍යවරුන් 585 ක් ලියාපදිංචිය අළුත් කරගෙන නොතිබුණි.	මේ සම්බන්ධයෙන් මුද්‍රිත මාධ්‍ය හා පළාත් ආයුර්වේද කොමසාරිස්වරුන් මඟින් දැනුවත් කොට ඇති බව, මේ අනුව ලියාපදිංචිය අලුත් නොකළ වෛද්‍යවරුන්ගේ නාමලේඛන දිස්ත්‍රික් මට්ටමින් සකස් කොට පළාත් ආයුර්වේද කොමසාරිස්වරුන් මඟින් ඔවුන් දැනුවත් කරමින් ලියාපදිංචිය අළුත් කිරීම සඳහා යොමු කර ගැනීමේ වැඩ පිළිවෙලක් ආරම්භ කර ඇති බව, ආයුර්වේද වෛද්‍ය නිලධාරීන්ගේ වාර්ෂික කාර්ය සාධන සිදුකිරීමේදී 2024 වර්ෂයේ සිට සක්‍රීය ලියාපදිංචි වෛද්‍යවරයෙක් වන බව තහවුරු කර ගැනීම සඳහා කටයුතු කරන බව, එසේම, ලියාපදිංචිය	ප්‍රකාශිත ආයුර්වේද වෛද්‍ය සභා රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. ලියාපදිංචිය දිරිගැන්වීම සහ ලියාපදිංචිය අලුත් කිරීමේ ආදායම එකතුකර ගැනීම සඳහා සුදුසු ක්‍රමවේද අනුගමනය කළ යුතුය.

	අලුත් කිරීම සහ මියගිය වෛද්‍යවරුන් පිළිබඳ තොරතුරු වෛද්‍ය සභාව වෙත වාර්තා කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ දේශීය වෛද්‍ය අංශය යටතේ සේවයේ නියුතු සංවර්ධන නිලධාරීන්ගේ සහය ලබා ගැනීම සඳහා සංවර්ධන නිලධාරීන්ගේ රාජකාරී ලැයිස්තුවට එම කරුණ ඇතුළත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකර දෙන ලෙස අමාත්‍යාංශය වෙත ලිඛිතව දැනුම් දී ඇති බව, මෙම ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීම දැනටමත් ආරම්භ කර ඇති අතර එහි ප්‍රගතියක් දක්නට ඇති බව.	

1.6 මුදල් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
සභාවේ බැංකු ජංගම ගිණුමේ රුපියල් මිලියන 7ත් 14ත් අතර ශේෂයක් සමාලෝචිත වර්ෂයේ එක් එක් මාසය අවසානයේ පැවති අතර සාමාන්‍ය දෛනික ගනුදෙනු අවශ්‍යතාවය රඳවාගෙන ඉතිරි මුදල් ආයෝජනය කිරීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි.	ආයුර්වේද වෛද්‍ය සභාවේ 2024 පෙබරවාරි 13 දින තීරණය අනුව පරිගණක/පරිගණක මුද්‍රණ යන්ත්‍ර සහ උපාංග මිලදී ගැනීම, කාර්යාලයේ ජනෙල් සඳහා ග්‍රිල් සවි කිරීම, ලේඛනාගාරය සකස් කිරීම, ආයුර්වේද වෛද්‍ය සභා ගොඩනැගිල්ලේ ඉදිරිපස වහල සැකසීම, ආයුර්වේද වෛද්‍ය සභා ගොඩනැගිල්ල ඉදිරිපිට මිදුල (Garden) සැකසීම ආදී කටයුතු වෙනුවෙන් දළ ඇස්තමේන්තුවක් ලෙස රු.9,907,856 මුදලක් අනුමත කරන ලද බව, ඒ අනුව එම කටයුතු සභාවේ පවතින මූල්‍ය තත්ත්වය මත	ආයතනයේ අනාගත ස්ථාවර පැවැත්ම සඳහා ආයෝජන වත්කම් ගොඩනගා ගැනීමට කටයුතු කළ යුතුය.

	සිදු කිරීමට තීරණය කළ බව, ඒ අනුව පරිසණක මිලදී ගැනීමට හා ලේඛනාගාරය සකස් කිරීමට කටයුතු ආරම්භ කළ අතර සභාව විසුරුවා හැරීම නිසා 2024 වර්ෂයේ සිදු කර ගැනීමට නොහැකිවූ බව, එම කටයුතු සිදු කිරීම සඳහා සභාවේ මුදල් යොදා ගැනීමට සැළසුම් කළ බැවින් වෙනත් ආයෝජන වත්කම් ගොඩනැගීමට කටයුතු නොකරන ලද බව.ආයතනයේ අනාගත ස්ථාවර පැවැත්ම සඳහා ආයෝජන වත්කම් ගොඩනගා ගැනීමට කටයුතු කළ යුතුය. විමර්ශනයන් අවසන් කර නොමැති පැමිණිලි පිළිබඳ 2025 වර්ෂයේ දී කටයුතු කරනු ලබන බව.	

2. මෙහෙයුම් සමාලෝචනය

2.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	**කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරුන්ගේ වෘත්තීය විෂමාචාර සම්බන්ධයෙන්, 2023 වර්ෂයට අදාළව එක් පැමිණිල්ලක් හා 2024 වර්ෂයේ ලද පැමිණිලි 11න් පැමිණිලි 07ක විමර්ශනයන් අවසන් කර නොතිබුණි.	විමර්ශනයන් අවසන් කර නොමැති පැමිණිලි පිළිබඳ 2025 වර්ෂයේ දී කටයුතු කරනු ලබන බව.	සියලු පැමිණිලි විමර්ශනය කර අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතු අතර පැමිණිලි සම්බන්ධයෙන් පසු විපරම් සිදුකිරීම හා කාලීනව එහි ප්‍රගතිය අගය කිරීම සිදුකළ හැකි වන පරිදි අංගසම්පූර්ණ තොරතුරු පවත්වා ගත යුතුය. පොලිසිය වෙත යොමුකර තිබුණු පැමිණිලි සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳවද පසු විපරම් කළ යුතුය.

2.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 20(1) වගන්තිය ප්‍රකාරව ආයුර්වේද වෛද්‍ය සභාව නීතිගත සංස්ථාවක් වන බැවින් 1971 අංක 38 දරන මුදල් පනතට අනුකූලව මුදල් පාලනය සිදු කරන නමුත් විධිමත් අධීක්ෂණයක් සහිත ගිණුම්කරණ ඒකකයක් ස්ථාපිත කිරීම කෙරෙහි පාලක සභාවේ අවධානය යොමු කර නොතිබුණි.	2024 වර්ෂයේ දී මේ පිළිබඳ සභාවේ අවධානය යොමු කරමින් කටයුතු කිරීමට සටහන් කර ගන්නා ලද බව.	විධිමත් අධීක්ෂණයක් සහිත ගිණුම්කරණ ඒකකයක් ස්ථාපිත කළ යුතුය.

2.3 ප්‍රසම්පාදන කළමනාකරණය

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 මාර්ගෝපදේශ ප්‍රකාරව, අවම වශයෙන් වර්ෂ 03ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ලැයිස්තු ගත කරමින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	2025 වර්ෂයේ සිට මේ අනුව කටයුතු කරන ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලද බව.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතුය.

3. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

3.1 උපායමාර්ගික සැලැස්ම

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 02 ඡේදය අනුව ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශ 2.3 ඡේදය ප්‍රකාරව පිළියෙල කළ යුතු උපායමාර්ගික සැලැස්ම එකී විධිවිධාන ප්‍රකාරව පිළියෙල කර නොතිබුණි.	රාජ්‍ය ව්‍යාපාර අයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශ 2.3 අනුව උපායමාර්ගික සැලැස්ම පිළියෙල කිරීමට කටයුතු කරනු ලබන බව.	රාජ්‍ය ව්‍යාපාර අයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශ 2.3 අනුව උපායමාර්ගික සැලැස්ම පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය.